# ආත්මයම උදුරාගැනීම

## ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සහ යුක්ති ක්ෂේත්‍රයන් හි ලිංගික අල්ලස් පිළිබඳ අධ්‍යයනය

**සංක්ෂිප්ත පත්‍රිකාව**




Centre for Equality and Justice

# ආත්මයම උදුරාගැනීම

## ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සහ යුක්ති ක්ෂේත්‍රයන් හි ලිංගික අල්ලස් පිළිබඳ අධ්‍යයනය

### සංක්ෂිප්ත පත්‍රිකාව



සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය මගින් 2021 සිට 2022 දක්වා සිදු කළ ගුණාත්මක අධ්‍යයනයක් හරහා හඳුනාගත් ලිංගික අල්ලස පිළිබඳ ප්‍රධාන අන්තර්දෘෂ්ටීන් මෙම සංක්ෂිප්ත පත්‍රිකාවෙන් ඉස්මතු කරයි. අධ්‍යයනයෙහි සවිස්තරාත්මක වාර්තාව සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය වෙතින් ලබාගත හැක.

© **සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ), ශ්‍රී ලංකාව. සියලුම හිමිකම් ඇවිරිණි.**

නිර්මාණය සහ පිරිසැලසුම: දනුශ්‍රී වැලිකල

මුද්‍රණය හා ප්‍රකාශනය: දෙසැම්බර් 2022

සහයෝගය: ආසියා පදනම

කතු හිමිකම ඇවිරෙන පරදි මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් ප්‍රතිනිෂ්පාදනය, ගබඩා කිරීම හා විද්‍යුත්, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම හෝ වෙනත් ආකාරයකින් බෙදාහැරීම සපුරා තහනම්.

වැඩි විස්තර සඳහා:
**සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය**
16/1, මොරිස් පෙදෙස, කොළඹ 5, ශ්‍රී ලංකාව
දු.ක./ෆැක්ස්: _94 11 2055404
විද්‍යුත් තැපෑල: srilanka.cej@gmail.com

ISBN 9786245847211

# අන්තර්ගතය


1. ලිංගික අල්ලස යනු කුමක්ද? 7

2. ශ්‍රී ලංකාව තුළ අල්ලස හා දූෂණය 8

3. සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් සිදු කරන ලද අධ්‍යයනය 9

4. පර්යේෂණයට සහභාගිවූවන් 9

    4.1 ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් සහභාගිවූවන්ගේ පැතිකඩ 9

    4.2 සහභාගි වූ ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ පැතිකඩ 11

    4.3 හඳුනාගත් අපරාධකරුවන් අයත් වන වර්ග සහ ලිංගික ඉල්ලීම් වලට හේතු 11

5. ලිංගික අල්ලස ඉල්ලීම සඳහා භාවිතා කර ඇති ක්‍රම 12

6. ලිංගික අල්ලසෙන් දිවිගලවාගත් පුද්ගලයින් ලිංගික අල්ලස් ඉල්ලීම් කෙරෙහි දැක්වූ ප්‍රතිචාර 12

7. ලිංගික අල්ලසඃ ත්‍රිමාන ගැටලුවක 13

8. ප්‍රධාන සොයාගැනීම් 16

9. නිර්දේශ 19

# ලිංගික අල්ලස යනු කුමක්ද?

රාජ්‍ය නිලධාරියෙකු කිසියම් රාජ්‍ය සේවයක් සැපයීම සිදු කරනු ලබන ලිංගික ඉල්ලීම් ලිංගික අල්ලස යනුවෙන් හැඳින්වේ. මෙහි දී ලිංගික ඉල්ලීම ලබා නොදෙන්නේ නම්, සේවාව ලබා නොදෙන බව විශ්වාස කිරීමට පුද්ගලයින් පොළඹවයි. උදාහරණ ලෙස රැඳවුම් භාරයේ සිටින පවුලේ සාමාජිකයින් බැහැදැකීමේ අයිතීන්, පොලිස් පැමිණිලි මත ක්‍රියා කිරීම, සහ රජයේ රෝහලක සායනයකට ප්‍රවේශවීම ඇතුළත් වේ. ජාත්‍යන්තර කාන්තා විනිසුරුවරියන්ගේ සංගමය ලිංගික අල්ලස 'ලිංගික කප්පම් ගැනීම' ලෙස විස්තර කරන අතර, එය 'රජයේ ප්‍රතිලාභයක් ලබා ගැනීම වෙනුවෙන් හුවමාරුවක් ලෙස ලිංගික ක්‍රියාකාරකමක නියැලීම සඳහා කෙරෙන පැහැදිලි හෝ ව්‍යංග ඉල්ලීමක්' ලෙස අර්ථ දක්වයි.[1] ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ආයතනය එය විස්තර කරන්නේ, 'මුදල් වෙනුවට ලිංගික ක්‍රියාකාරකම අල්ලසෙහි මුදල් ඒකකය වන දූෂණය ලෙස ය. එය ඇතැම් රටවලට හෝ අංශවලට පමණක් සීමා නොවන අතර, එය බලය පැවරී ඇති අය අවංක බවින් තොරව, අවදානමට ලක්විය හැකි සහ ඔවුන්ගේ බලය මත යැපෙන අයව ලිංගිකව සූරා කෑමට උත්සාහ කරන ඕනෑම තැනක දැකගත හැක.'[2]

ලිංගික අල්ලස යනු ඉලක්කගත ක්‍රියා මාර්ග අවශ්‍ය කරන බරපතළ ගැටලුවක් ලෙස හඳුනාගත යුතු බව ගෝලීය වශයෙන් දැන් පිළිගෙන තිබේ. දැනට, දූෂණයට එරෙහි එක්සත් ජාතික සම්මුතිය (2004) ලිංගික අල්ලස නිශ්චිතව හඳුනාගෙන හෝ තහනම් කර නොමැත. නමුත් එක්සත් ජාතීන්ගේ සංවිධානය[3] සහ ජාත්‍යන්තර නීතිඥ සංගමය වැනි වෙනත් ප්‍රමුඛ ජාත්‍යන්තර ආයතන ලිංගික අල්ලස යනු දූෂණයෙහි ආකාරයක් බව පිළිගෙන ඇත. ඒ අතරම, එය මානව හිමිකම් උල්ලංඝනයක් සහ අපරාධයකි.[4]

ශ්‍රී ලංකාව තුළ, අල්ලස් පනත (1965) ප්‍රකාශ කරන්නේ, රාජ්‍ය සේවාවක් ලබාගැනීම සඳහා හෝ රාජ්‍ය සේවාවක් සිදු කිරීම සඳහා බලපෑම් කිරීම වෙනුවෙන් 'පාරිතෝෂය' ක් ඉල්ලීම හෝ ලබාදීම අල්ලසට සමාන වන බවයි.[5] මෙම පනත 'පාරිතෝෂය' පුළුල්ව අර්ථ දක්වයි.[6] එබැවින් ලිංගික අල්ලස් තහනම් බව අල්ලස් පනත තුලින් අර්ථ නිරූපණය කිරීමට නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහ අධිකරණයට හැකිය. 1998 දී අභියාචනාධිකරණය විසින් තීරණය කරනු ලැබුවේ අල්ලස් පනත යටතේ 'පාරිතෝෂය' යන්න 'එහි වඩා විශාල අර්ථයෙන් භාවිතයට ගනු ලබන බවයි... ලිංගික සංසර්ගය සඳහා ඇතිවන දැඩි ආශාව... මානසික හා ශාරීරික ආශාවන්ට උදාහරණයක් වන අතර, එය සතුටට පත් කිරීමේ පරිතෝෂයක් වන අතර එය මුදලින් තක්සේරු කළ නොහැක.'[7] මෙය ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පිරිමි ජ්‍යෙෂ්ඨ ආරක්ෂක කළමනාකරුවෙකු කාන්තා ආරක්ෂක නිලධාරිනියෙකුගෙන් ලිංගික අල්ලසක් ඉල්ලීම වෙනුවෙන් අල්ලස් පනත යටතේ වරදකරුවෙකු වූ නඩුවකි. ලිංගික අල්ලස අල්ලස් පනත යටතට වැටෙන බවට පිළිගත් ශ්‍රී ලංකාව තුළ වාර්තා වන එකම නඩුව මෙය වේ. 2021/2022 දී සිදුකළ අධ්‍යයනය ඇතුළුව, සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් සිදුකරන ලද අධ්‍යයනවලින් හෙළි වන්නේ ලිංගික අල්ලස බරපතළ ගැටලුවක් බවයි. ලිංගික අල්ලස පිළිබඳ මෙම වාර්තා තිබියදීත්, නඩු පැවරීමට සහ වරදකරුවෙකු කිරීමට ක්‍රියාමාර්ග නොමැති වීමෙන් ඇඟවනු ලබන්නේ, ලිංගික අල්ලස සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ව්‍යංග තහනමක් ප්‍රමාණවත් හෝ ඵලදායී නොවන බවයි. ලිංගික අල්ලස වැළැක්වීමට හා එයට පිළියම් කිරීමට සහ එය දූෂණයේ ආකාරයක් ලෙස, සාපරාධී වරදක් ලෙස හා මානව හිමිකම් උල්ලංඝනයක් ලෙස පිළිගැනීමට නම්, නීතිය මගින් ලිංගික අල්ලස පැහැදිලිව තහනම් කළ යුතු ය. ලිංගික අල්ලස නිශ්චිත සාපරාධී ක්‍රියාවක් යනුවෙන් නම් කරන ලෙස ලෙස අල්ලස් පනත සංශෝධන කිරීම සඳහා සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් උද්දේශනය කර ඇත. මෙම අධ්‍යයනයට සහභාගිවූවන්ගේ අදහස් වුයේ ද, ලිංගික අල්ලස වැළැක්වීමට සහ එයට පිළියම් කිරීමට, පැහැදිලි, නිශ්චිත සහ ශක්තිමත් නීතියක් අවශ්‍ය බවයි.

[1] නම් කිරීම, ලැජ්ජා කිරීම සහ ලිංගික කප්පම් ගැනීම අවසන් කිරීම: මෙවලම් කට්ටලය (ජාත්‍යන්තර කාන්තා විනිසුරුවන්ගේ සංගමය 2012) 9

[2] ලිංගික කප්පම් වටා ඇති නිශ්ශබ්දතාවය බිඳ දැමීම: බලය, ලිංගිකත්වය සහ දූෂණය අතර සම්බන්ධතාවය 8 (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්,2020)

[3] දූෂණයේ නිර්වචනයක් ලෙස ලිංගික කප්පම් ගැනීම ඇතුළත් කළ හැකි බව එක්සත් ජාතීන්ගේ සම්මුතීන් දෙකක් දක්වයි; දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය. ශ්‍රී ලංකාව මෙම සම්මුතීන් පිළිවෙළින් 2004 සහ 2006 දී අනුමත කරන ලදී.

[4] ලිංගික කප්පම්: දූෂණය සහ ලිංගික සූරාකෑමේ අපරාධයක් (ජාත්‍යන්තර නීතිඥ සංගමය 2019)

[5] ලිංගික කප්පම්: දූෂණය සහ ලිංගික සූරාකෑමේ අපරාධයක් (ජාත්‍යන්තර නීතිඥ සංගමය 2019)

[6] සංශෝධිත 1954 අල්ලස් පනත.

[7] කතුබිදීන්ට එරෙහිව ශ්‍රී ලංකා ජනරජය ඎ1998% 3 ශ්‍රී එල් ආර් 107, 117. උසාවිය විසින් එච් එස් ගෞර්, ඉන්දියාවේ දණ්ඩ නීතිය උපුටා දක්වන ලදී. (ඉන්දීය නීති ප්‍රකාශකයින්) වෙළුම් අංක 1 (සංස්කරණය නිශ්චිතව දක්වා නොමැත)

## ශ්‍රී ලංකාව තුළ අල්ලස සහ දූෂණය

මේ දක්වා සිදු කර ඇති අධ්‍යයනයන්ට අනුව, අල්ලස හා දූෂණය ශ්‍රී ලංකාව තුළ (රාජ්‍ය) පද්ධතීන් තුළට කා වැදී ඇති අතර අතර මුල්බැස ගෙන ද ඇත. ලිංගික අල්ලසෙහි සිද්ධීන් පිළිබඳව කෙළින් ම හෝ දෙවැන්නෙක් හරහා තමන් දැනුවත් බවට 60% ත් වැඩි ප්‍රමාණයක් දෙනා වාර්තා කිරීමත් සමඟ, ලිංගික අල්ලස සැලකිය යුතු ගැටලුවක් ලෙස හඳුනා ගෙන ඇත.[8] දූෂණ සංජානන දර්ශකය මඟින් (Corruption Perceptions Index) රටවල් 180 කින් ශ්‍රී ලංකාව 102 ලෙස ශ්‍රේණි ගත කර ඇති අතර, 2021 සඳහා ශ්‍රී ලංකාව ලද ලකුණු ප්‍රමාණය සියයට 37 කි.[9] ගෝලීය දූෂණ බැරෝමීටරයට අනුව, රජයේ දූෂණය 'විශාල ගැටළුවක්' බව 79% ක් සිතන අතර, පසුගිය මාස 12 තුළ රාජ්‍ය සේවය භාවිතා කළ අයගෙන් 16% ක් අල්ලසක් ගෙවා තිබුණි (2020 වසර වන විට ලබාගත හැකිවූ දත්තවලට අනුව).[10]

'ගෝලීය දූෂණ බැරෝමීටරය 2019 ශ්‍රී ලංකාව' නම් වූ වාර්තාව රට තුළ ලිංගික අල්ලස සිදුවීම් (ලිංගික කප්පම් ගැනීම) පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා දෙයි. මෙම වාර්තාවට අනුව, 60% කට වැඩි පිරිසකට ලිංගික අල්ලස් ඉල්ලීම් හා අදාළ අත්දැකීම්වලට සෘජුව මුහුණ දී හෝ එවැනි අත්දැකීම්වලට මුහුණ දුන් වෙනත් පුද්ගලයන් පිළිබඳ දැන සිටියහ.[11] ප්‍රතිචාරකයින්ගෙන් 46% කට 'ලිංගික කප්පම් ගැනීම කලාතුරකින්, බොහෝ විට හෝ නිතරම' සිදුවූ බව හැඟුණි.[12] නාගරික ප්‍රතිචාරකයින් ග්‍රාමීය ප්‍රතිචාරකයින්ට වඩා ලිංගික කප්පම් ගැනීම බහුලව සිදුවන බව වටහා ගෙන තිබුණි. සැලකිය යුතු කරුණක් වන්නේ, වතු අංශයේ නියැදිය තුළ සහභාගීවූවන්ගෙන් අඩකට හැඟී තිබුණේ 'ලිංගික කප්පම් ගැනීම බොහෝ විට හෝ නිතර නිතරම සිදු වූ බවයි.'[13]

රාජ්‍ය සේවයක් ලබා ගැනීමේදී කාන්තාවන් ලත් අත්දැකීම් පිළිබඳව වසර 2014 දී කළ අධ්‍යයනයකින් හෙළි වූයේ, පසුගිය මාස 6 තුළ කාන්තාවන්ගෙන් 52.3% දෙනෙක්ට අල්ලස හා දූෂණය අත් විඳීමට සිදු වූ බවයි. කුටුම්භ 501 ක් සහ රාජ්‍ය සේවය තුළ ප්‍රධාන අංශ 10 ක් අතර, මෙම අධ්‍යයනය සිදු කර තිබුණි. නීති අංශය තුළ 58.1% ක් ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ 30.9% ක්ද, සෞඛ්‍ය අංශය තුළ 28% ක් ද ලෙස දූෂණය වාර්තා විය. වතු අංශයේ (65.6%) සහ ගැටුමෙන් බලපෑමට ලක්වූ ප්‍රදේශවල (64.8%) කාන්තාවන් වෙත අල්ලස් හෝ දූෂණය සඳහා ප්‍රවේශවීමේ වැඩි අවදානමක් පවතින බව අධ්‍යයනයකින් සොයා ගෙන තිබුණි. මෙම අධ්‍යයනය තුළ, නාගරික කාන්තාවන් (38.6%) ට වඩා ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන් (68.2%) අල්ලසට හා දූෂණයට ලක්වූ බව වාර්තා විය. අවසානකොට, කාන්තා ගෘහ මූලිකයින් (59.7%) පිරිමි ගෘහ මූලිකයින් ට (49.6%) වඩා අල්ලසට හා දූෂණයට යටත්වීමේ හැකියාව ඇති බව සොයා ගන්නා ලදී.[14] අල්ලසක් ලෙස ගෙවන ලද මුදලෙහි සාමාන්‍යය රුපියල් 1,429.00 ක් බව මෙම අධ්‍යයනය මගින් ගණනය කරන ලදී.

ලිංගික අල්ලස යන ගැටලුව පිළිබඳව පසුගිය වසර කිහිපය තුළ සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් අධ්‍යයන තුනක් සිදු කරන ලදී. 'ශ්‍රී ලංකාව තුළ යුද්ධයේ බලපෑමට හසුවූ උතුරු පළාතේ කාන්තා ගෘහ මූලිකයින් ලිංගිකව සූරාකෑම' (2016 මාර්තු) යන අධ්‍යයනය ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින්ගේ අත්දැකීම් පිළිබඳව වූ සිද්ධි අධ්‍යයන විසි පහක් මත පදනම් විය. ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් මෙම පුද්ගලයින් යුද්ධයෙන් බලපෑමට ලක්වූ උතුරු පළාතේ සහ පුත්තලම දිස්ත්‍රික්කයේ අය වූහ. 'රහස් බව තුළ මුවාවී: පශ්චාත්-යුධ දිස්ත්‍රික්ක තුළ මුස්ලිම් කාන්තාවන් ලිංගික අල්ලසට ලක්වීම' (2018 ජුලි ) යනු ලිංගික අල්ලස් සිදුවීම් පිළිබඳව මුස්ලිම් කාන්තාවන් අතර සිදුකළ සම්මුඛ සාකච්ඡා දහයක් මත පදනම් වූ අධ්‍යයනයකි. මෙම අධ්‍යයනයට සහභාගි වූවෝ මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, පොළොන්නරුව සහ පුත්තලම දිස්ත්‍රික්ක වලින් වූහ. 'ශ්‍රී ලංකාවේ හමුදා වැන්දඹුවන් ලිංගික අල්ලසට ලක්වීම' (2018 ජුලි) යනු අනුරාධපුරය, කුරුණෑගල සහ ගාල්ල යන

[8] 'ගෝලීය දූෂණ බැරෝමීටරය' (ට්‍රාන්ස්පෙරන්සි ඉන්ටර්නැෂනල්, 2019) 30
[9] 'දූෂණ සංජානන දර්ශකය 2021' (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්, 2022) 3
[10] 'ගෝලීය දූෂණ බැරෝමීටරය ආසියා 2020' (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් 2021) 51
[11] 'ගෝලීය දූෂණ බැරෝමීටරය' (ට්‍රාන්ස්පෙරන්සි ඉන්ටර්නැෂනල්, 2019) 30
[12] 'ගෝලීය දූෂණ බැරෝමීටරය' (ට්‍රාන්ස්පෙරන්සි ඉන්ටර්නැෂනල්, 2019) 19
[13] 'ගෝලීය දූෂණ බැරෝමීටරය' (ට්‍රාන්ස්පෙරන්සි ඉන්ටර්නැෂනල්, 2019) 19
[14] 'රාජ්‍ය සේවයේ දූෂණය පිළිබඳ කාන්තා අත්දැකීම්' (ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්, ශ්‍රී ලංකාව, ජූනි 2014) 42

දිස්ත්‍රික්කවල සිදුකළ සිද්ධි අධ්‍යයන දහයක් මත පදනම් වූ අධ්‍යයනයකි. 'ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස ආමන්ත්‍රණය කිරීම සඳහා නීතිය සහ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම' (2020 අගෝස්තු) යන වාර්තාව සහ 'ශ්‍රී ලංකාව තුළ ලිංගික අල්ලස අවසන් කිරීම, නෛතික හා ක්‍රියා පටිපාටිමය ප්‍රතිසංස්කරණ, දෙවැනි කොටස' (2022 අප්‍රේල්) යන මේවායින් සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් ලිංගික අල්ලස නිශ්චිතවම සාපරාධී ක්‍රියාවක් ලෙස නම් කිරීමට ශ්‍රී ලංකාවේ නීතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිර්දේශ ලබා දෙයි.

## සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය මගින් සිදුකළ අධ්‍යයනය

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් ශ්‍රී ලංකාව තුළ ලිංගික අල්ලසෙහි සිදුවීම් සහ ස්වභාවය අවබෝධ කර ගැනීමට දරන උත්සාහය අඛණ්ඩව කරගෙන යාම සඳහා 2021-2022 දක්වා අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම අධ්‍යයනය රාජ්‍ය සේවයේ වැදගත් අංශ දෙකක් වන යුක්තිය සහ සෞඛ්‍යය සහ විශේෂිත කණ්ඩායම් දෙකක් වන කාන්තාවන් සහ  සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ සාමාජිකයින් කෙරෙහි අවධානය යොමු කළේය. දකුණු පළාත හැර, මීට පෙර ලිංගික අල්ලස පිළිබඳ අධ්‍යයනය සඳහා ඉලක්ක ගත කළ පළාත් සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් බැහැර කරන ලදී. එබැවින්, මෙම අධ්‍යයනයට මධ්‍යම, බස්නාහිර, ඌව, දකුණු සහ සබරගමුව පළාත්වල සිදු කරන ලද ගැඹුරු සහ දීර්ඝ සම්මුඛ සාකච්ඡා 19 ක් ද, ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා පහක් ද ඇතුළත් විය. ජාතික හා කලාපීය මට්ටමින් යුක්තිය හා සෞඛ්‍යය අංශ වල ප්‍රධාන තොරතුරු සපයන්නන්ගෙන් ලබා ගත් සම්මුඛ සාකච්ඡා 12ක් භාවිතයෙන් පෙර සඳහන් කළ දත්තවලින් ලබා ගත් ගැඹුරු අවබෝධය තවදුරටත් ඌනපූරණය කෙරිණි.

කාන්තාවන් සහ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුළුතර කණ්ඩායම් ශ්‍රී ලංකාව තුළ වෙනස්කොට සැලකීම අත් විඳිති. එපමණක් නොව, ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 365 වන වගන්තියට ලබා දී ඇති අර්ථ නිරූපණය හේතුවෙන්, ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුළුතරයින් ලිංගික ක්‍රියාකාරකම්වල යෙදෙන විට සාපරාධී ක්‍රියාකාරකම්වල යෙදෙන බවට උපකල්පනය කර ඇත.[16] මෙම බරපතල ගැටලුව රැකියා, නිවාස, නෛතික පිළියම්, ආදියට ඇති අයිතීන් වෙත ප්‍රවේශවීමේ දී සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ සාමාජිකයින්ට එරෙහි වෙනත් ආකාරවල වෙනස්කොට සැලකීම් වලට මඟ පාදා ඇත.

## පර්යේෂණයට සහභාගිවූවන්

### ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් සහභාගිවූවන්ගේ පැතිකඩ

මෙම අධ්‍යයනයට කාන්තාවන් සහ සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ සාමාජිකයින් පරාසයක් සම්බන්ධ වූ අතර, ඔවුන්ගේ ප්‍රධාන ගුණාංග සමහරක් පහත සාරාංශගත කර ඇත.



[15] ශ්‍රී ලංකාවෙන් ලිංගික අල්ලස තුරන් කිරීම : නීතිමය සහ ක්‍රියා පටිපාටිමය ප්‍රතිසංස්කරණය II කොටස (සමානාත්මතාවය සහ යුක්තිය සඳහා මධ්‍යස්ථානය, අප්‍රේල් 2022)

[16] 'දැනුම, ආකල්ප සහ සංජානන සමීක්ෂණ වාර්තාව: ලිංගිකත්වය පිළිබඳ ශ්‍රී ලංකා සමාජයේ අදහස් සහ ශ්‍රී ලංකාවේ බඨ්ඊඹ පුද්ගලයින්ගේ අත්දැකීම්' (සමාජ විද්‍යාඥයින්ගේ සංගමය 2021); නීතිය සහ ප්‍රතිපත්ති විසින් ශ්‍රී ලංකාවේ බඨ්ඊඹෂු+ ප්‍රජාව අතහැර දැමීම පිළිබඳ නැවත සිත බැලීම (ප්‍රජාතන්තවාදය සඳහා වෙස්මිනිස්ටර් පදනම 2021

| පළාත | දිස්ත්‍රික්කය | වයස (කථනය සිදු කරන විට) | වෙනත් විස්තර |
|---|---|---|---|
| මධ්‍යම පළාත | මහනුවර | 49 | වැන්දඹු මව |
| | හැටන් | 49 | මව (විවාහක), පුරුෂයා රෝගාතුරය |
| | මාතලේ | 50 | මව (විවාහක), මෙම සිදුවීම සැමියා විදේශගතව රැකියාව කරන විට සිදුවූවකි |
| | මාතලේ | 23 | කාන්තාව (ගෘහණිය) |
| | මහනුවර | 23 | කාන්තාව (ගෘහණිය) |
| | මහනුවර | 32 | කාන්තාව (ගෘහණිය) |
| | මාතලේ | 49 | කාන්තාව (කුඩා තේ වත්තක සම-හිමිකාරිය) |
| සබරගමුව පළාත | රත්නපුර | 38 | මව |
| | රත්නපුර | 43 | මව, ස්වයං රැකියාවක නිතර වන්නීය |
| | රත්නපුර | 46 | මව, සැමියා සමග ආහාර ව්‍යාපාරයක සම-හිමිකාරිත්වය දරන්නීය |
| දකුණු පළාත | හම්බන්තොට | 22 | පාසැල් සිසුවා |
| | හම්බන්තොට | 39 | මව |
| | මාතර | 42 | සෞඛ්‍ය අංශයේ සේවක කරන ශාරීරික ආබාධ සහිත කාන්තාව |
| | හම්බන්තොට | 29 | කාන්තා වෛද්‍ය ශිෂ්‍යාව |
| | ගාල්ල | 44 | කාන්තා සංක්‍රමික ගෘහ සේවිකාව |
| බස්නාහිර පළාත | කොළඹ | 38 | සංක්‍රාන්ති සමාජභාවී ලිංගික ශ්‍රමික |
| | ගම්පහ | 40 | කාන්තා ලිංගික ශ්‍රමික |
| | කොළඹ | 22 | සංක්‍රාන්ති සමාජභාවී ලිංගික ශ්‍රමික |
| | කොළඹ | 23 | සංක්‍රාන්ති සමාජභාවී ලිංගික ශ්‍රමික |

## සහභාගි වූ ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ පැතිකඩ

| සෞඛ්‍ය අංශය | යුක්ති අංශය |
|---|---|
| විශේෂඥ මනෝ චිකිත්සක | ප්‍රධාන පොලිස් පරීක්ෂක |
| පශ්චාත් උපාධි වෛද්‍ය පුහුණුලාභියා | පොලිස් පරීක්ෂක |
| වෛද්‍ය සහ ශාස්ත්‍රඥ | අපරාධවල වින්දිතයින් සහ සාක්ෂිකරුවන් සුරැකීම සඳහා වන ජාතික අධිකාරියේ නිලධාරී |
| මහජන සෞඛ්‍ය සේවිකා | නීති වෘත්තික |
| මහජන සෞඛ්‍ය සේවිකා | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි නිලධාරී |
| විශ්‍රාමික හෙද සහ විද්වතා | නීති වෘත්තික |

## හඳුනාගත් අපරාධකරුවන් අයත් වන වර්ග සහ ලිංගික ඉල්ලීම් වලට හේතු

ලිංගික අල්ලසෙන් දිවිගලවාගත් පුද්ගලයින් විසින් හඳුනාගත් සියලුම අපරාධකරුවෝ පිරිමි පුද්ගලයන් වූහ. කෙසේවෙතත්, යුක්ති අංශයේ ප්‍රධාන තොරතුරු සපයන්නෙකු සඳහන් කළේ, සමහර අවස්ථාවල දී කාන්තාවන් ද අපරාධකරුවන් ලෙස හඳුනා ගෙන ඇති බවයි. සෞඛ්‍ය අංශයේ ප්‍රධාන තොරතුරු සපයන්නෙකු ද මෙය නිරීක්ෂණය කර තිබුණි. එසේ වුවද, ප්‍රධාන තොරතුරු සපයන්නන් සමග පැවති සම්මුඛ සාකච්ඡා වල ප්‍රධාන අදහස වූයේ අපරාධකරුවන් පිරිමි වන බව සඳහන් කිරීම වැදගත් ය.

| චෝදනා ලත් අපරාධකරු | ලබාදුන් සේවාව/ උත්තේජනය කළ සිද්ධිය |
|---|---|
| යුක්ති අංශය | |
| පිරිමි නීතිඥයා | විස්තෘත පවුල (extended family) තුළ ඉඩම් ආරවුලක් හේතුවෙන් නීති උපදෙස් ලබාගැනීම |
| පිරිමි පොලිස් නිලධාරියා | දියණිය නිවසට ආපසු නොපැමිණීම ගැන පොලීසියට කළ පැමිණිල්ලක් හේතුවෙන් |
| පිරිමි පොලිස් නිලධාරියා | රිමාන්ඩ් ගතව සිටින සැමියාට ඇප ලබා ගැනීම |
| පිරිමි පොලිස් නිලධාරියා | නැති වූ හැඳුනුම්පත වෙනුවට නව හැඳුනුම්පතක් ලබාගැනීම සඳහා පොලිස් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම |
| පිරිමි නීතිඥයා | ඇප ලබාගැනීමේ අවශ්‍යතාවය මතු වූ ඉඩම් ආරවුලක් සම්බන්ධයෙන් නීති නියෝජනය ඉල්ලා සිටීම |
| පිරිමි නීතිඥයා | ඉඩම් ආරවුලක් සම්බන්ධයෙන් නීති නියෝජනය ඉල්ලා සිටීම |
| පිරිමි පොලිස් නිලධාරියා | දික්කසාද නඩු කටයුත්තක දී නීතිය බලාත්මක කිරීම |
| පිරිමි බන්ධනාගාර නිලධාරියා | රිමාන්ඩ්ගතව සිටින සැමියා බැහැදැකීමේ අයිතීන් ඉල්ලා සිටීම |

| චෝදනා ලත් අපරාධකරු | ලබාදුන් සේවාව/ උත්තේජනය කළ සිද්ධිය |
|---|---|
| පිරිමි පොලිස් නිලධාරියා | සංක්‍රමික රැකියාව සඳහා පිටත්ව යාමට පෙර පවුල් ප්‍රතිලාභ වාර්තාව සඳහා අනුමැතිය ලබාගැනීම |
| පිරිමි පොලිස් නිලධාරියා | චෝදනා එල්ල කිරීමෙන් වැළකී සිටීමට, අත්අඩංගුවේ සිට නිදහස් කර ගැනීමට |
| පිරිමි පොලිස් නිලධාරියා | සැමියාව අත්අඩංගුවෙන් නිදහස් කර ගැනීමට |
| පිරිමි පොලිස් නිලධාරියා | චෝදනා එල්ල කිරීමෙන් වැළකී සිටීමට, සහ අත්අඩංගුවේ සිට නිදහස් කර ගැනීමට |
| සෞඛ්‍ය අංශය | |
| පිරිමි හෙද | රෝහල තුළ සිටිය දී සැමියාට අමතර රැකවරණය (සාත්තුව) ලබාදීම |
| පිරිමි රෝහල් උපස්ථායක | මව වෙනුවෙන් රෝහලේ සායන උපදේශක සේවාව සඳහා අංකයක් ලබා ගැනීම |
| පිරිමි රෝහල් උපස්ථායක | මව වෙනුවෙන් රෝහලේ සායනික විශේෂඥ සේවාව සඳහා කලින් (ඉක්මන්) හමුවීමක් ලබා ගැනීම |
| පිරිමි වෛද්‍යවරයා | වෛද්‍ය උපදෙස් ලබා ගැනීම |
| සෞඛ්‍ය අංශයේ පිරිමි රාජ්‍ය නිලධාරියා | ස්ථාන මාරුවක් වැළැක්වීමට උත්සාහ කිරීම |
| වෛද්‍ය අධීක්ෂක | පුහුණුව අතරතුර නේවාසිකාගාර පහසුකම් සඳහා නිර්දේශය ලබා ගැනීම |
| පිරිමි රෝහල් උපස්ථායක | අදාළ නීතිරීති උල්ලංඝනය කරමින් රෝහලක සිටින රෝගියෙකු බැහැදැකීමට අවසර පත්‍රයක් ලබාදීමට |

## ලිංගික අල්ලස ඉල්ලීම සඳහා භාවිත කර ඇති ක්‍රම

ලිංගික ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා අපරාධකරුවෝ විවිධ පරාසයක වූ ක්‍රම රාශියක් භාවිතා කළහ. මේවාට වාචික සහ සෘජු ඉල්ලීම්, වාචික එහෙත් වක්‍ර ඉල්ලීම්, දුරකථන ඇමතුම් සහ කෙටි පණිවිඩ ඇතුළත් විය. සමහර අවස්ථාවල දී, ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයාගෙන් බලෙන් ලිංගික අල්ලස් ලබා ගෙන තිබුණි. මෙම අධ්‍යයනයට සහභාගි වූ සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ සාමාජිකයින් විසින් අපරාධකරුවන් සිදු කරන ශාරීරික ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳව වැඩිපුර වාර්තා කරන ලදී.

## ලිංගික අල්ලසෙන් දිවිගලවාගත් පුද්ගලයින් ලිංගික අල්ලස් ඉල්ලීම් කෙරෙහි දැක්වූ ප්‍රතිචාර

මෙම අධ්‍යයනයට සහභාගි වූ බොහෝ ලිංගික අල්ලසෙන් දිවිගලවාගත් පුද්ගලයින් ලිංගික අල්ලස් ඉල්ලීමට යටත් වීම ප්‍රතික්ෂේප කර තිබුණි. මෙම අධ්‍යයනයට සහභාගිවූ සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ ලිංගික ශ්‍රමිකයින් ඉල්ලීම්වලට යටත් වු අතර, අපරාධකරුවන්ගෙන් බේරීමට හෝ මඟහැර යාමට අවස්ථාවක් ඔවුන්ට ලැබී නොතිබිණි. ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයෝ ලිංගික අල්ලස් සඳහා වන ඉල්ලීමකට යටත් වීමට සිදුවීම ගැන කෝපය, කලකිරීම, බිය සහ සාංකාව ප්‍රකාශ කළහ.

## ලිංගික අල්ලස: ත්‍රිමාන ගැටලුවක්

ලිංගික අල්ලස යනු සංකීර්ණ ගැටලුවක් වන අතර එය බහුමාන වේ. මෙම අධ්‍යයනය අන්තර්සම්බන්ධිත අංග තුනක් කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ ලිංගික අල්ලස දූෂණයේ ආකාරයක් ලෙස, මානව හිමිකම් උල්ලංඝනයක් ලෙස සහ සාපරාධී වරදක් ලෙසය. මෙම අංග එකිනෙකට සමීපව අන්තර්සම්බන්ධ වන අතර අතිච්ඡාදනය වේ.

### 1. ලිංගික අල්ලස යනු දූෂණයයි

> ‘ මේක තමයි අන්තිම පහත්ම අල්ලස. ඇත්තෙම ඉල්ලනව වගේ වැඩක්නෙ මේක. ’
>
> ජීවා (මාතලේ දිස්ත්‍රික්කය, මධ්‍යම පළාත)

> ‘ මේ සිද්ධියෙන් පස්සෙ මම හරි බය වුණා, කෙනෙක් එක්ක (පිරිමි කෙනෙක් එක්ක) වැඩිය කතා කරන්න, මූණක් බලලවත් කතා කරන්න. රජයේ නිලධාරියෙක් එක්කවත් ප්‍රශ්නෙ කියන්න බය වුණා. ’
>
> සීතා (හැටන්, මධ්‍යම පළාත)

මෙම අධ්‍යයනයේ දී ගවේශනය කරන ලද ලිංගික අල්ලස් පිළිබඳ සිදුවීම් විශේෂයෙන් බලය අපයෝජනය කිරීමේ බරපතළ ආකාරයක් විය. රාජ්‍ය නියෝජිතයෝ තමන්ට පැවරී ඇති අධිකාරිය සහ අභිමතය අපයෝජනය කරමින්, තමන් නීතියෙන් සැපයීමට බැඳී සිටින සේවාවන් සැපයීම සඳහා ලිංගික අල්ලස් ඉල්ලා සිටිති. ගැඹුරු සම්මුඛ සාකච්ඡාවලින් හෙළිදරව් වනුයේ අපරාධකරුවන් දඬුවම් ලැබීමකින් තොරව කටයුතු කරන බවයි. ලිංගික අල්ලසෙන් දිවිගලවා ගත් පුද්ගලයින් හට කම්පනය/අපවාදය සමග කටයුතු කිරීමට සිදුවන අතර, ඔවුන්ට එළදායී නීතිමය පිළියම් නොමැත.

එබැවින්, ලිංගික අල්ලස යනු මුල් බැසගත් දූෂණය පිළිබඳ සාක්ෂියකි. එය රාජ්‍යයේ කේන්ද්‍රීය කාර්යය ඉටුකිරීමට රජය අපොහොසත් වූ බවට සාක්ෂියකි - එනම් තම ජනතාවට සේවය කිරීම සඳහා තම අද්විතීය අධිකාරිය සහ බලතල භාවිතා කිරීමය. තවද ලිංගික අල්ලස යනු ප්‍රජාතන්ත්‍රවාදය අසාර්ථක වන බවට ඇඟවීමකි. මහජන නියෝජිතයෝ නීතියේ සීමාව තුළ තම රාජකාරි ඉටුකිරීමට අපොහොසත් වනවා පමණක් නොව, ජන්දය සහ නීතිය හරහා ඔවුන් උකහා ගනු ලබන අධිකාරිය සක්‍රීයව අපයෝජනය කරති.

### 2. ලිංගික අල්ලස යනු මානව හිමිකම් උල්ලංඝනයකි

> ‘ ජොබ් එක වෙනුවෙන් ඕනම දෙයක් කරනවා කියන අදහස මගේ ඔළුවෙ තිබුණෙ. ඒත් ඒ දේ වෙනුවෙන් ජීවිතේම දෙන්න වුනා. ඒක කරලවත් නිදහසක් නැතිවුණා. දවස් දෙකක්ම අර විදියට කෝල් කරා.දෙවනි දවසෙ මං කිව්වා. කැමති වුනා. ඒ කැමැත්ත නෙවෙයි අසරණකමට වෙන ඔප්ෂන් එකක් නැති නිසා කියන තැනකට එන්නම් කිව්වා. ’
>
> ඉරෝෂි (මාතර දිස්ත්‍රික්කය, දකුණු පළාත)

> ‘ මම මානසිකව උපරිමයෙන්ම වැටුණා. මොකද මම වැරැද්දක් කරල නෑ. මම කවදාවත් ඇඟ පේන්න ඇඳුමක්වත් අඳින කෙනෙක් නෙවෙයි. සිද්ධියෙන් පස්සෙ මට නින්ද යන්නෙ නෑ. මට කල්පනාව නැති වෙනවා. නිතර අමතක

වෙන්න පටන් ගත්තා. ඒ කියන්නෙ මගෙ අතේ මොකක් හරි දෙයක් තියෙනව නම් මම ඒක අතේ තියාගෙන හැමතැනම හොයනවා. රෑට මම අඬනවා. ඇයි මටම මෙහෙම වෙන්නෙ කලිනුත් මේ වගේ කරදර මට වුණා කියලා. මට කලිනුත් වෙච්ච සිද්ධි මතක් වෙනවා. එදා ඉඳල මේ වෙනකල්ම සිද්ධි මතක් වෙනවා (වැළපෙයි). ’

‘ මම මේ සිද්ධියෙන් පස්සෙ, හිතේ කැකෑරිච්ච ඉස්සර සිද්ධිත් එක්ක ජීවිතේ නැති කරගන්න එක ගැන පවා හිතල තියෙනවා (වැළපෙයි). ’

මනෝරි (ගම්පොල, මධ්‍යම පළාත)

‘ මම මේ සිද්ධියෙන් පස්සෙ, හිතේ කැකෑරිච්ච ඉස්සර සිද්ධිත් එක්ක ජීවිතේ නැති කරගන්න එක ගැන පවා හිතල තියෙනවා (වැළපෙයි). ’

මනෝරි (ගම්පොල, මධ්‍යම පළාත)

ලිංගික අල්ලස තමන්ගේ මානව අභිමානය උල්ලංඝනය කරන බව ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් වාර්තා කර ඇත. එය කම්පනය හා අපවාදය රැගෙන එන ලිංගික හානියකි. එය පුද්ගලයෙකුගේ ශාරීරික සම්පූර්ණත්වය හා පෞද්ගලිකත්වයට ඇති අයිතිය උල්ලංඝනය කිරීමකි. ලිංගික අල්ලසෙන් දිවිගලවාගත් පුද්ගලයින් කිහිප දෙනෙක් ලිංගික අල්ලස හේතුවෙන් ඔවුන්ට මුහුණ දීමට සිදුවූ මානසික හා ශාරීරික සෞඛ්‍ය ගැටලු ගැන සඳහන් කළහ. ඔවුන් රාජ්‍ය නිලධාරීන්ව වටහා ගන්නා ආකාරය ගැන දිගුකල් පවතින බලපෑමක් එමගින් ඇති කළ බව ද ඔවුහු සඳහන් කළහ. බොහෝ අවස්ථාවල දී, ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් හට මහජන සේවාවන් කෙරෙහි ප්‍රවේශවීමේ අයිතිය, ජීවනෝපායයකට ඇති අයිතිය, සහ අත්අඩංගුවේ පසුවන පුද්ගලයින්ගේ පවුලේ සාමාජිකයින් ලෙස ඔවුන්ට ඇති අයිතීන්, වැනි අයිතීන් භුක්ති විඳීම ලිංගික අල්ලස මගින් වළක්වයි.

එබැවින්, ලිංගික අල්ලස මගින් ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින්ගේ සිවිල් හා දේශපාලනික අයිතීන් මෙන් ම ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතීන් ද උල්ලංඝනය කරයි. ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් බොහෝ පුද්ගලයින්ට තමන් අත්විඳින ලද අසාධාරණකම් වලට පිළියම් සෙවිය නොහැකි බව මෙම අධ්‍යයනය තුළ පැහැදිලි විය. ඔවුන්ට එලදායී පිළියම් නොතිබුණි. මෙම ගැටලුව තවදුරටත් පහත සාකච්ඡා කෙරේ.

## 3. ලිංගික අල්ලස සාපරාධී වරදකි

ලිංගික අල්ලස යනු ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින්ගේ ශාරීරික සම්පූර්ණතාවයට කෙරෙන බරපතළ සහ ආපසු හැරවිය නොහැකි හානියකි. තවද එය පුද්ගලයෙකුගේ පෞද්ගලිකත්වයට සහ සමාජ ව්‍යුහයට කරන හානියකි. රාජ්‍ය සේවා සපයන්නන් තම සේවය පතා තමන් වෙත පැමිණෙන අයගෙන් ලිංගික ඉල්ලීම් කරන විට, එය රාජ්‍ය ආයතනවල සහ නීතියෙහි ආධිපත්‍යයෙහි සඵලතාව සහ තිරසාරභාවය සෝදා පාළුවට ලක් කරයි. බොහෝ අවස්ථාවල දී, ලිංගික අල්ලස් ඉල්ලීම සඳහා සමාජ මාධ්‍ය හා ජංගම දුරකථන භාවිතා කර තිබුණි. අපරාධකරුවන් නිවසේ දී හා රාත්‍රී කාලයේ දී ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් තැනැත්තන්ව ඉලක්ක කළ අතර, ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් තැනැත්තන්ට ඔවුන්ව මඟ හැරීමට විකල්ප නොතිබුණි. මෙවැනි පුරුදු, අපරාධකරුවන් තුළ දඬුවම් කළ යුතු සාපරාධී හැසිරීම් සඳහා උදාහරණ වේ. එකඟතාව (කැමැත්ත) ලිංගික අල්ලසෙහි ඇති කේන්ද්‍රීය ගැටලුවකි. ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් සමහර පුද්ගලයෝ වාචිකව ප්‍රතික්ෂේප කිරීමට උත්සාහ දරන අතර, සමහරුන්ට එය ප්‍රතික්ෂේප කිරීමට ශාරීරික ප්‍රචණ්ඩත්වය භාවිතා කිරීමට සිදුවන අතර, බොහෝ විට එය සාර්ථක නොවේ. වෙනත් අවස්ථාවල දී, කැමැත්ත හෝ කැමැත්ත නොමැතිකම සිද්ධියට වැදගත් නොවේ. ලිංගික ප්‍රචණ්ඩත්වයෙහි නිරත වීමට අපරාධකරුවෝ බලහත්කාරකම හෝ ප්‍රචණ්ඩත්වය භාවිතා කරති. එවැනි අවස්ථාවල දී අපරාධය ලිංගික අල්ලසක් මෙන්ම ලිංගික ප්‍රචණ්ඩත්වය ලෙස ද අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

ලිංගික අල්ලස් ඉල්ලා සිටීමේ දී අපරාධකරුවන් දඬුවම් නොලබා (දණ්ඩමුක්තිය සහිතව) ක්‍රියා කරන බව අධ්‍යයනයෙන් පැහැදිලි විය. ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් බිය, සමාජ අපකීර්තිය, අපරාධ යුක්ති පද්ධතිය කෙරෙහි විශ්වාසයක් නොමැති කම, සහයෝගය නොමැතිකම සහ තමන් අසරණ බව හැඟීම හේතුවෙන් පැමිණිලි කිරීමට අපොහොසත් වී ඇත. ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් බොහෝ තැනැත්තන්ට ලිංගික අල්ලසෙහි අත්දැකීම විනාශකාරී සහ කම්පා සහගත එකක් ලෙස හැඟුණි. ඔවුහු ඒ වනවිටත් දුප්පත්කම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හේතුවෙන් වෙනස්කොට සැලකීම සහ රැකවරණය ලබාදීමේ වගකීම් වැනි සමාජ යථාර්ථයන්ට මුහුණ දෙමින් සිටියහ. ඔවුන් වෙත කරන ලද ලිංගික ඉල්ලීමට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට චිත්තවේගීය, මූල්‍ය හෝ සමාජීය සම්පත් ඔවුන්ට නොතිබුණි.

අධ්‍යයනයේ තීරණාත්මක සොයා ගැනීමක් වනුයේ, අපරාධ යුක්තිය ඉටුකිරීම පැවරී ඇති සේවක පිරිස් ම අපරාධකරුවන් ලෙස, ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් විසින් හඳුනාගෙන තිබීම ය. සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ සාමාජිකයින් සමඟ පැවති ගැඹුරු සහ දීර්ඝ සම්මුඛ සාකච්ඡාවල දී සහ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡාවල දී මෙය ඉතා පැහැදිලිව අනාවරණය විය. පොලිස් නිලධාරීන් හෝ බන්ධනාගාර නිලධාරීන් ලිංගික අල්ලසෙහි අපරාධකරුවන් බවට චෝදනා ලබන විට, තමන් යුක්ති අංශයෙන් වින්දිතයන් බවට පත්වන බව ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින්ට හැඟේ. නීතිය බලවතුන්ට අනුග්‍රහය දක්වමින් තමන්ව ගොදුරු කර ගන්නා බව ඔවුහු සඳහන් කරති. ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් සිතන්නේ යුක්තිය හෝ වගවීම ගැන බලාපොරොත්තුවක් නොමැති බවයි.

> " එතකොට "දැන් එහෙනම් උඹ ගාව මොනවද තියෙන්නෙ අපිට දෙන්න" කියල ඇහුවා. "උසාවි නොදා ඉන්න නම් අපිත් එක්ක හිටපන් - අපිට ෆන් එකක් දීපන්" කියල කිව්වා.
> මම මේ ඔක්කොම කියන්නෙ තව කෙනෙකුට මේව වෙන්නෙ නැති වෙන්න. "
>
> නුස්රාත් (කොළඹ, බස්නාහිර පළාත)

> " නිකරුණේ පොලිස් උසාවි ගානේ යන්න බැහැ අනේ. අනිත් එක නීතියත් උන්ටම ගිහිං. අපි ලැජ්ජ වෙනව විතරයි. "
>
> ගයානි (හම්බන්තොට, දකුණු පළාත)

> " පොලිසියෙ එක්කෙනෙක් දැක්කත් දැන් පාරක්වත් අහන්න බයයි! නොදන්නා නම්බර් එකකින් ෆෝන් එක රිං වෙනව දකිද්දි පපුව ගැහෙනවා අදටත්. "
>
> ජීවා (මාතලේ, මධ්‍යම පළාත)

> " නීතිය ආරක්ෂා කරන්න ඉන්න කෙනෙක් මේ විදිහට හැසිරෙන එක අනිවාර්යයෙන්ම ලොකු වැරැද්දක් බව හිතුවා. "
>
> ලලිතා (මාතලේ, මධ්‍යම පළාත)

# ප්‍රධාන සොයාගැනීම්

## පෞද්ගලික බලපෑම

- ලිංගික අල්ලස මඟින් ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් මත ගැඹුරු මනෝවිද්‍යාත්මක සහ චිත්තවේගීය බලපෑමක් ඇති කරයි.
- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයෝ සිද්ධිය හේතුවෙන් අභ්‍යන්තර අපකීර්තිය හා සමාජ අපකීර්තිය අත් විඳිති.
- සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ සාමාජිකයින් වාර්තා කළ ලිංගික අල්ලසෙහි ආකාරයන් දරුණු සහ අමානුෂික විය.
- ලිංගික අල්ලස රාජ්‍ය සේවා වෙත ප්‍රවිෂ්ට වීමට බාධකයකි. ලිංගික අල්ලස් වෙත ගොදුරු වේ යැයි යන බිය හේතුවෙන්, සායනයකට සහභාගි වීම වැනි රාජ්‍ය සේවා වෙත ප්‍රවේශවීම අත්හිටුවීම හෝ අත්‍යවශ්‍ය නම් මිස රාජ්‍ය සේවා ලබාගැනීමෙන් වැළකී සිටීමට ඔව්හු උත්සාහ දරති.
- ලිංගික අල්ලස විසින් ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් හට ජීවනෝපායයකට ඇති අයිතිය හා ඉඩම් හිමිකාරීත්වය සඳහා අති අයිතිය වැනි ඔවුන්ගේ ආර්ථික අයිතීන් භුක්ති විඳීමෙන් වළක්වයි.
- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් විශ්වාසවන්ත පුද්ගලයෙකු සමග හැර ඔවුන්ගේ අත්දැකීම් ගැන කතා කර නොමැත. එබැවින්, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් අධ්‍යයනයට සහභාගී වීමට සහ සංවේදනාත්මකව සවන් දෙන්නෙකුට රහස්‍ය භාවයේ පදනම මත සිද්ධිය සිහිපත් කිරීමට ලද අවස්ථාව සතුටින් පිළිගත්හ.
- ලිංගික අල්ලස හේතුවෙන් තමන් අත්දකින කම්පනය සහ සමාජ අපකීර්තිය සමග කටයුතු කිරීමට මනෝ-සමාජීය සහයෝගය ලබාගැනීම පිළිබඳව ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් දැනුවත් වී නොමැති අතර ඔවුන්ට ඒ සඳහා සම්පත් ද නොමැත.

## සන්නිවේදන තාක්ෂණය

- ලිංගික ඉල්ලීම් කිරීමට සහ ඔවුන් පුද්ගලිකව ලබා දුන් ලිංගික අල්ලස් අඛණ්ඩව ඉල්ලා සිටීමට අපරාධකරුවෝ සන්නිවේදන තාක්ෂණය සහ සමාජ මාධ්‍ය භාවිත කළහ. සන්නිවේදන තාක්ෂණය ලිංගික අල්ලස් ඉල්ලා සිටීමේ පොදු ක්‍රමයක් විය.
- ජංගම දුරකථන තාක්ෂණය සහ සමාජ මාධ්‍ය හරහා අපරාධකරුවන්ට තම ලිංගික ඉල්ලීම් නොනවත්වා සිදු කළ හැකි නිසා ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින්ට අපරාධකරුවන් ඔවුන් ලුහුබැඳ විත් දඩයම් කරන බව හැඟුණි.
- අපරාධකරුවන් විසින් ලිංගික අල්ලස් ඉල්ලීමේ දී සඳහා ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින්ගේ දත්ත වල රහස්‍යතාවයට ඇති අයිතිය සහ පෞද්ගලිකත්වයට ඇති අයිතිය උල්ලංඝනය කර ඇත. ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින්ගේ පෞද්ගලික තොරතුරු රාජ්‍ය සේවකයින් විසින් ලිංගික අල්ලස් සඳහා භාවිතා කරන ලදී. එය සාපරාධී වරදකි.

## සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ සාමාජිකයන් මත බලපෑම

- ලිංගික ශ්‍රමිකයන් වන සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ සාමාජිකයින් තමන් ලිංගික අල්ලස් සඳහා පුරුද්දක් ලෙස ඉලක්කගත වන බව ඔවුන්ට හැඟේ.
- ලිංගික අල්ලස නිසා ඇති වන අපකීර්තිය, කම්පනය හා ආර්ථික දුෂ්කරතාවල බරපතලකම සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් සඳහා තවත් සංකීර්ණ වේ. 'ස්වභාව ධර්මයේ පිළිවෙලට එරෙහි ස්වේච්ඡා කාමුක සංසර්ගය' සහ ලිංගිකත්වයෙහි 'ඕනෑම බරපතල අශෝභන ක්‍රියාවක්' ශ්‍රී ලංකාව තුළ සාපරාධීකරණය කිරීම හේතුවෙන් ඔවුන් දැනටමත් වින්දිතයන් බවට පත්ව ඇත.

- සමාජය තුළ ඔවුන්ගේ කොන්කිරීමට ලක්ව ඇති තත්ත්වය නිසා, සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ සාමාජිකයන් සිතන්නේ, ලිංගික අල්ලස පිළිබඳ වරද සඳහා ඔවුන්ට නීතිය තුළ පිළිසරණක් නොමැති බවයි.

## පවුල සහ ප්‍රජාව මත බලපෑම

- පවුලේ සාමාජිකයින් ලිංගික අල්ලස් සිදුවීමකට මුහුණ දුන් විට, එවැනි පවුලේ සාමාජිකයන් හිරිහැර කිරීම් වලට ඉලක්ක ගත විය හැකි බැවින් ඔවුහු අවදානමට ලක්වෙති.
- ලිංගික අල්ලස ලිංගික අල්ලසෙන් දිවිගලවා ගත් පුද්ගලයින් හට තමන්ගේ ආරක්ෂාව හා තම පවුලේ සාමාජිකයන්ගේ ආරක්ෂාව පිළිබඳව බියක් ඇති කරවයි. තමන් සහ තම පවුලේ සාමාජිකයන් වෙත ලිංගික ඉල්ලීම් සමග අපරාධකරුවන් යළි ප්‍රවේශ විය හැකි බව ඔවුන්ට හැඟේ. ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් හට අපරාධකරුවන් විසින් තමන්ව දඩයම් කරන බවක් හැඟේ.
- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් ලිංගික අල්ලස පිළිබඳ සිද්ධිය සිය ආදරණීයයන් ගෙන් රහසක් ලෙස තබාගන්නා විට, එය ඔවුන්ගේ පුද්ගලික සබඳතා මත සහ ඒ හේතුවෙන් ඔවුන්ගේ යහපැවැත්ම මත අහිතකර බලපෑමක් ඇති කරයි.
- සමහර අවස්ථාවල දී, ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් හට ඇති සහාය සහ සැනසිල්ලේ එකම මූලාශ්‍රය වන්නේ ඔවුන්ගේ සමීප සහ විශ්වාසනීය සමාජ සහයෝගය යි.

## ලිංගික අල්ලසෙහි අවදානමට ලක්වීමට මග පාදන සාධක

- යුක්ති සහ සෞඛ්‍ය අංශයේ ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ අදහස වූයේ තම අංශය තුළ ලිංගික අල්ලස සිදුවන බව ය. එවැනි සිදුවීම් ගැන බොහෝ දෙනෙකුට ඇත්තේ දෙවැනි පාර්ශව වලින් ලද දැනුම ය.
- කාන්තාවන් සම්බන්ධයෙන් ගත් කල, තම කලත්‍රයා නිවසේ නොසිටීම (රැකියාව හේතුවෙන් හෝ රැඳවුම් භාරයේ සිටීම හේතුවෙන්) ඔවුන්ව ලිංගික අල්ලසෙහි අවදානමට ලක් කරයි.
- නීති විරෝධි ද්‍රව්‍ය බෙදා හැරීම වැනි නීති විරෝධි ක්‍රියාකාරකම්වලට සම්බන්ධවීම හෝ ලිංගික ශ්‍රමිකයෙකු වීම වැනි නීති විරෝධි ලෙස වටහා ගෙන ඇති ක්‍රියාකාරකම් විසින් ද කාන්තාවන් සහ සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ සාමාජිකයින් ලිංගික අල්ලසෙහි අවදානමට ලක් කරයි.
- දරිද්‍රතාවය සහ ආබාධිතතා යනු කාන්තාවන් සහ සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ සාමාජිකයන් ලිංගික අල්ලසෙහි අවදානමට ලක් කරන තවත් සාධක දෙකකි.
- සමහර අවස්ථාවල දී, රාජ්‍ය අංශයෙහි සේවා පැතීමේ ක්‍රියාව පමණක් ම ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් ලිංගික අල්ලසෙහි අවදානමට ලක් කර ඇත. ප්‍රධාන තොරතුරු සපයන්නන් විසින් පුහුණුලාභීන්, කණිෂ්ඨ සේවකයින්, සහ සේවා ලබාගන්නන් ලිංගික අල්ලසෙහි වින්දිතයින් ලෙස හඳුනා ගන්නා ලදී.

## ලිංගික අල්ලස පිළිබඳව ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින්ගේ අවබෝධයන්

- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් ලිංගික අල්ලස දුටුවේ ආචාරධර්මවලට අනුව සහ සදාචාරාත්මකව වැරදි ලෙස ය.
- ලිංගික අල්ලස පැහැදිලිවම නීතියෙන් තහනම් කර තිබේ ද යන්න පිළිබඳව බොහෝ දෙනෙකුට විශ්වාසයක් නොතිබුණ නමුත්, එය සාපරාධී වරදක් විය යුතු බව ඔවුන්ගේ අදහස විය.
- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයෝ ලිංගික අල්ලස අත්දැකීම හේතුවෙන් බිය, අසරණකම හා සාංකාව හැඟෙන බව විස්තර කළහ.
- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් හට තමන් වෙනත් බොහෝ වින්දිතයින් අතර එක් අයෙකු වන බවට හැඟීමක් තිබුණි.

## අපරාධකරුවන්ගේ අවබෝධයන් (ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් වාර්තා කළ පරිදි)

- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් අයගේ කැමැත්ත නොතකා, අපරාධකරුවන් විසින් ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින්ව වස්තුවක් ලෙස සලකා ලිංගික ආස්වාදය ලබා ගන්නා මූලාශ්‍රයක් බවට පත් කරන ලදී.
- සමහර අපරාධකරුවන්ට ලිංගික අල්ලස ගැන තිබුණේ එය අතිශයින් සාමාන්‍ය සහ ගනුදෙනුවක් වන බවට ආකල්පයකි. ඔවුන්ගේ ඉල්ලීම ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් මත ඇති කරන බලපෑම ගැන ඔවුන් උදාසීන වූ බව මෙන්ම ඒ ගැන ඔවුන්ට තැකීමක් නොතිබූ බව ද පෙනේ.
- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් බොහෝ පුද්ගලයින් පැහැදිලිව හෝ ව්‍යංගයෙන් සිය කැමැත්ත ලබාදීම ප්‍රතික්ෂේප කළහ. නමුත් එවැනි අවස්ථා කිහිපයකදීම, අපරාධකරු ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයාගේ කැමැත්ත නොමැති වීම පිළිබඳව නොසලකා හැර තිබුණි.
- සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ ලිංගික ශ්‍රමිකයින් පවසන්නේ අපරාධකරුවන් තමන්ගේ කැමැත්ත නොසලකන බවයි. අපරාධකරුවන්ට තමන්ගේ කැමැත්ත වැදගත් නොවන බව ඔවුහු පවසති. උපකල්පනය ලෙස පෙනී යන්නේ ඔවුන් ලිංගික ශ්‍රමිකයින් බැවින්, ලිංගික අල්ලස් ලබාදිය යුතු බවයි.

## ලිංගික අල්ලස් සඳහා වන පිළියම් ගැන වටහාගැනීම්

- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් ලිංගික අල්ලස වෙනුවෙන් නීතිමය පිළියම් සෙවීමට අකැමති වීමට හේතුව ලෙස ප්‍රධාන තොරතුරු සපයන්නන් විසින් හඳුනා ගන්නා ලද්දේ, අපරාධකරුවන් භුක්ති විඳින දඬුවම් නොලබා යාම යි.
- නීතිය, නීති නිලධාරීන්, සහ නීති ආයතන තමන්ගේ අයිතීන් ආරක්ෂා කරන බවට ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් වටහා ගත්තේ නැත. ඔවුන්ගේ සමීප අත්දැකීම වූයේ නීතිය මගින් ලිංගික අල්ලස් ඉල්ලන අපරාධකරුවන් සහ නීති ආයතන වල සේවය කරන සේවක පිරිස් ආරක්ෂා කරන බවයි.
- නීතිය හෝ නීති ආයතනවලට ලිංගික අල්ලස සඳහා තමන්ට ඵලදායී පිළිතුරක් ලබා දියහැකි බව ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් සිතුවේ නැත.
- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින්ගේ අදහස වූයේ, ලිංගික අල්ලස ගැන සිදු කරන ඕනෑම විමර්ශනයක්, එවැන්නක් සිදු කළත්, අපක්ෂපාතී හෝ විශ්වාස කටයුතු නොවන බවයි.
- පැමිණිල්ලක, විමසීමක හෝ විමර්ශනයක ප්‍රසිද්ධ ස්වභාවය ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් තැනැත්තන් කිසියම් නීතිමය පිළියමක් සෙවීමෙන් වළක්වන ලදී. පවතින ක්‍රියා පටිපාටි වින්දිත-හිතකාමී ලෙස නොදකින ලදී.
- අපරාධකරුවන් විසින් ඔවුන්ට නීතියෙන් පැවරී ඇති රහස්‍යභාවය ලිංගික අල්ලසින් දිවි ගලවා ගත් පුද්ගලයන්ගෙන් ලිංගික අල්ලස් ඉල්ලීම සඳහා අනිසි ලෙස භාවිතා කර තිබුණි.
- 'ස්වභාව ධර්මයේ පිළිවෙලට' එරෙහි ලිංගික ක්‍රියාවන් සාපරාධීකරණය කිරීම සහ පාදඩ ආඥාපනත යටතේ ලිංගික ශ්‍රමිකයින් අත්අඩංගුවට ගැනීම හේතුවෙන්, ලිංගික ශ්‍රමිකයින් සහ සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ සාමාජිකයින්ගේ මතය වූයේ, ඔවුන්ට නීතියෙන් යම් ආරක්ෂාවක්, පිළියමක් හෝ යුක්තිය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කළ නොහැකි බවයි.

## වසංගතයෙහි බලපෑම

- වසංගතය අතරතුර එහා මෙහා යාම සීමා කිරීම මගින්, ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් හට යම් ආරක්ෂාවක් ලැබුණි. ඔවුන්ට අපරාධකරු සමග සම්බන්ධතා වළක්වා ගත හැකි විය.
- සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ ලිංගික ශ්‍රමිකයින් ගත් කල, වසංගතය මඟින් ලිංගික අල්ලස

කෙරෙහි ඔවුන්ට පැවති අවදානම වැඩි කළේ ය. ඔවුන්ගේ ජීවනෝපායයෙහි නියැලීම සඳහා ඔවුන්ට ඇඳිරි නීතිය කඩ කිරීමට සිදුවූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුහු ලිංගික ඉල්ලීම්වල ඉලක්ක බවට පත් වූහ.



# නිර්දේශ

## රාජ්‍යය සඳහා වන නිර්දේශ

- ස්වාධීන ව්‍යවස්ථාදායක සභාවක් යළි හඳුන්වා දීම හරහා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ ස්වාධීනත්වය තහවුරු කිරීම.
- දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියට දේශීය නීතිමය බලපෑමක් ලබාදීම සඳහා බලාත්මක කරන නීති සම්පාදනයක් සම්මත කිරීම.
- ලිංගික අල්ලස සහ ලිංගික ආකාර වල පාරිතෝෂිකයන් ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ හරහා පැහැදිලිව ම තහනම් කිරීම සහ සාපරාධී කිරීම.
- කැමැත්ත දෙන/සහිත වැඩිහිටියන් අතර අස්වාභාවික ලිංගික හැසිරීම් සාපරාධී කරන දණ්ඩ නීති සංග්‍රහයේ 365 වන වගන්තිය අහෝසි කිරීම.
- පාදඩ ආඥාපනත අහෝසි කිරීම.
- පොදු ස්ථාන සහ රාජ්‍ය සේවාවන්ට ප්‍රවේශය ඇතුළුව සියලු ම ක්ෂේත්‍ර තුළ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුළුතරයන්ගේ සමාන අයිතීන් පැහැදිලිව ම පිළිගැනීම.
- අදහස් විමසීමේ ක්‍රියාවලියකින් පසුව වාණිජ ලිංගික ශ්‍රමය නීතිගත කිරීම සහ නියාමනය සඳහා නීති සම්පාදනය කිරීම.
- ලිංගික අල්ලස සිදුවීම සඳහා හේතු විමසීමට අධ්‍යයනයන් පැවැත්වීම.
- එවැනි අධ්‍යයනයන් හි සොයාගැනීම් ප්‍රසිද්ධියේ බෙදාහදා ගැනීම.
- ලිංගික අල්ලස සහ එහි දරුණුකම පිළිබඳව මහජනයා අතර දැනුවත්භාවය ඇති කිරීම.
  - ජාතික මට්ටමේ සිට ප්‍රජා මට්ටම දක්වා සෑම මට්ටමක ම දැනුවත් කිරීම් සිදුවිය යුතු ය.
  - එවැනි වැඩසටහන් කාන්තාවන් සහ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුළුතරයන් වෙත ළඟා වන බව සහතික කළ යුතු ය.
  - දැනුවත් කිරීමේ දී රංග කලාව සහ කලාව

සම්බන්ධ කර ගැනීම.

- දැනුවත් කිරීම සඳහා ෆෙස්බුක්වැනි සමාජ මාධ්‍ය භාවිතා කිරීම.
- රාජ්‍ය සේවකයින් හරහා සහ සමෘද්ධිලාභීන් සඳහා වන රැස්වීම් වැනි රැස්වීම් හරහා ප්‍රජා මට්ටමේ දැනුවත්භාවය ඇති කිරීම.

- රාජ්‍ය නිලධාරීන් සහ පොලිසිය වැනි අනාගතයේ සිටිය හැකි අපරාධකරුවන් අතර දැනුවත් කිරීමේ වැඩසටහන් ඉලක්ක කර ක්‍රියාත්මක කිරීම.
- ලිංගික අල්ලස වැළැක්වීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සහ එයට පිළියම් යෙදීම සඳහා ජාතික මට්ටමින් නිශ්චිත ප්‍රතිපත්ති සම්මත කර ගැනීම. එවැනි ප්‍රතිපත්තියක් සකස් කළ යුතු වන්නේ සමස්ථය ඇතුළත් කෙරෙන සහ සියලු පාර්ශවකරුවන් සම්බන්ධ කරගන්නා සහභාගිත්ව ක්‍රියාවලියක් හරහා ය. ජාතික ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීමේ දී, කාන්තාවන්ගේ සහ ලිංගික අල්ලසට යටත් වීමේ වැඩි අවදානමක් ඇති සමරිසි පුරුෂ, සමසිරි කාන්තා, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර්ලිංගික, සහ අවිනිශ්චිත අනන්‍යතාවයන් සහිත ප්‍රජාවේ සමාජිකයින්ගේ අදහස් විශේෂයෙන් විමසිය යුතුය. ජාතික ප්‍රතිපත්තිය කලින් කලට සමාලෝචනයට ලක් කළ යුතු ය.
- ලිංගික අල්ලසට වින්දිතයින් වීමෙන් තමන් ලද අත්දැකීම් ගැන ප්‍රසිද්ධියේ කතා කිරීමට ලිංගික අල්ලසෙහි වින්දිතයින්ට දැනුම ලබාදීම සහ සවිබල ගැන්වීම. එමඟින් දැනුවත්භාවය ඇති කර ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින්ට සම්බන්ධ කර ඇති අපවාදය අඩු කරනු ඇත. එසේ ප්‍රසිද්ධියේ සම්බන්ධ වීම ද යුක්තිය සෙවීමට ඔවුන් දිරිමත් කරනු ඇත.
- රාජ්‍ය සේවකයින් අතර මෙන් ම මහජනතාව අතර ලිංගික අල්ලසට සම්බන්ධ අපවාදය පිළිබඳව ආකල්පමය වෙනසක් කෙරෙහි සක්‍රීයව කටයුතු කිරීම.
- ලිංගික අල්ලස පිළිබඳ සිදුවීම්වල දී තම සමහර සගයන් අපරාධයකට හවුල්වීම ගැන දැනුවත්භාවය ඇති කිරීමට පොලිස් නිලධාරීන් පුහුණු කිරීම. එවැනි පුහුණුවක් පොලීසිය හරහා ලිංගික අල්ලස සිදුවීම වැළැක්වීම සහ ලිංගික අල්ලස සඳහා ශුන්‍ය-ඊස්සීමේ ප්‍රතිපත්තියක් (zero-tolerance policy) ස්ථාපිත කිරීම අරමුණු කර ගත යුතු ය.
- ලිංගික අල්ලස් සිදුවීමේ දී තම සගයින් සහ යුක්ති අංශයේ සමහර සේවක පිරිස් අපරාධයකට හවුල්වීම පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීමට නීතිඥයින් පුහුණු කිරීම. එවැනි පුහුණු, ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින්ට නීතිමය පිළියම් සෙවීමට, අල්ලස් පනත, රාජ්‍ය නීති පිළියම් (මූලික අයිතිවාසිකම් සහ රිට් ආඥා) සහ පෞද්ගලික නීති ප්‍රතිකර්ම වුවද භාවිතා කිරීමට සහ සලකා බැලීමට නීතිඥයින් සන්නද්ධ කරනු ඇත.
- විශ්ව විද්‍යාල මට්ටම වැනි උසස් අධ්‍යාපන මට්ටමකින් පාර්ශවකරුවන් සහ මහජනතාව පුහුණු කිරීම අරමුණු කරගත් විශේෂයෙන් සකස් කළ පාඨමාලාවක් පිරිනැමීම. එවැනි අධ්‍යයන වැඩසටහන් ලිංගික අල්ලස මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් ලෙස, සාපරාධී වරදක් ලෙස මෙන් ම, දූෂණය විදහා දැක්වීමක් ලෙස ආමන්ත්‍රණය කිරීමට සැලසුම් කළ යුතු ය.
- ලිංගික අල්ලස පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමට හෝ විමසීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සහ මානව හිමිකම් කොමිෂන් සභාවට බලය පැවරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත සහ මානව හිමිකම් කොමිෂන් සභා පනත යන නීති තන්ත්‍රයන් සංශෝධනය කළ යුතු දැයි හඳුනාගැනීමට එම පනත් සමාලෝචනය කිරීම.
- අපරාධ වල වින්දිතයින් සහ සාක්ෂිකරුවන්ට උපකාර කිරීමේ සහ ආරක්ෂා කිරීමේ පනත සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම.
- විශේෂයෙන් අපරාධ සහ අපරාධ පිළිබඳ පැමිණිලි ප්‍රසිද්ධියේ වාර්තා කිරීමේ දී නිශ්චිතව වින්දිතයින්ට ආරක්ෂාව සැපයීම සඳහා, වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම.
- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් වෙනුවෙන් අතරමැදියන්ට ද පැමිණිලි කිරීමට හැකි වන පරිදි ලිංගික අල්ලස් ගැන පැමිණිලි කිරීමේ ක්‍රියාපටිපාටිය සමාලෝචනය කිරීම.
- පැමිණිලි කිරීම සඳහා රහසිගත හදිසි ඇමතුම් දුරකථන සේවාවක් ස්ථාපිත කිරීම.
- ලිංගික අල්ලසෙහි අපරාධකරුවන් හඳුනා ගැනීමට රහසිගත අපරාධ පරීක්ෂකයින් යොදා ගැනීම.

- ලිංගික අල්ලසට සම්බන්ධ අධිකරණ කටයුතු කැමරාගත කර තබා ගැනීම.
- ලිංගික අල්ලස සඳහා වන දඬුවමට බරපතල දඩයක් ඇතුළත් වන බව සහතික කිරීමට අල්ලස් පනත ප්‍රතිසංස්කරණය කිරීම.
- ලිංගික අල්ලසෙහි බරපතළකමට සමානුපාතික වන කාල සීමාවක් සඳහා රාජ්‍ය සේවයේ යෙදෙන අපරාධකරුවන්ට රැකියාවෙන් තහනම් කිරීමක් ක්‍රියාත්මක කිරීම.
- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයා සඳහා ඵලදායී වන්දියක් ලබාදීම.
- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් සඳහා ඵලදායී වන්දි මුදලක් ලබාදීම.
- පොලිස් නිලධාරීන් සඳහා උපදේශනය ලබාදීම.

## සිවිල් සමාජ සඳහා නිර්දේශ

- ලිංගික අල්ලස වැළැක්වීම සඳහා රාජ්‍යයෙහි වගකීම ඉටු කිරීම සමාලෝචනය කිරීමට අධ්‍යයන හා තක්සේරු කිරීම් සිදු කිරීම.
- ලිංගික අල්ලස වැළැක්වීමේ දී වර්තමාන නෛතික තන්ත්‍රය සහ පිළියම් පිළිබඳ ඵලදායීතාව නියාමනය කිරීම.
- ලිංගික අල්ලස සිදුවීම් සහ එහි බලපෑමේ දරුණුකම පිළිබඳව මහජනයා අතර සක්‍රීය අන්දමින් සිවිල් සමාජ සංවිධාන විසින් දැනුවත්භාවය ඇති කළ යුතු ය.
- ලිංගික අල්ලස ගැන පැමිණිලි කිරීමට කාන්තා කණ්ඩායම් සාමුහික ක්‍රියාමාර්ග ගත යුතු ය.
- ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුළුතරයන් සාමාන්‍යයෙන් වෙනස්කොට සැලකීම අත්විඳින බැවින්, ලිංගික අල්ලස සඳහා පිළියම් සෙවීමට සහ ඉදිරියේ දී එය සිදුවීම වැළැක්වීමට ඔවුන්ට සාමුහිකව සංවිධානය වී ඒකරාශී විය හැකිය.
- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් අතර එකමුතුකමේ සහ සහයෝගය දැක්වීමේ ජාලයක් වර්ධනය කිරීම.

## පෞද්ගලික අංශය, වෘත්තීය ආයතන සඳහා නිර්දේශ

- ලිංගික අල්ලස පිළිබඳව ශුන්‍ය-රිස්සීමේ ප්‍රතිපත්තියක් (zero-tolerance policy) ක්‍රියාත්මක කිරීම.
- ලිංගික අල්ලස පැහැදිලිව ම තහනම් කිරීමට සහ ශක්තිමත් හා සාධාරණ පැමිණිලි කිරීමේ යාන්ත්‍රණයක් සැපයීම සඳහා වෘත්තීය චර්යාධර්ම සංග්‍රහයන් සමලෝචනය කර සංශෝධනය කිරීම.
- ලිංගික අල්ලස සිදුවීම නියාමනය කිරීමට සිවිල් සමාජය දරන ප්‍රයත්නයන්ට සහයෝගය දැක්වීම.
- ලිංගික අල්ලස පැහැදිලිව ම සාපරාධී කිරීමට නීතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා උද්දේශනය කිරීමට දරන ප්‍රයත්නයන්ට සහයෝගය සහ අනුග්‍රහය දැක්වීම.
- ආයතනික මට්ටමින් ලිංගික අල්ලස පිළිබඳ පැමිණිලි ගැන විමර්ශනය කිරීමේ දී විනිවිද භාවය සහ වගවීම සහතික කිරීම.
- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින්ට සහයෝගය දැක්වීමේ අරමුදල් වලට දායක වීම.
- ලිංගික අල්ලසෙන් දිවි ගලවාගත් පුද්ගලයින් සඳහා ඵලදායී පිළියම් සහතික කිරීමට නීතිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා උද්දේශනය කිරීම.


ඔබගේ අයිතිවාසිකම් සඳහා
කොන්දේසි පැනවිය නොහැක
ලිංගික අල්ලස් යනු පිළිගත නොහැකි, දූෂණයේ එක් ආකාරයකි.
1954
ලිංගික අල්ලස් සිදුවීම් වාර්තා කරන්න

# ආශ්‍රිත ග්‍රන්ථ


- 'ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස් ආමන්ත්‍රණය කිරීම සඳහා නීතිය සහ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම' (අගෝස්තු 2020)
- 'යමක් වෙනුවෙන් යමක්: ශ්‍රී ලංකාවේ ලිංගික අල්ලස පිළිබඳ අධ්‍යනයක්' Daily FT :2020 ජනවාරි 24. https://www.ft.lk/Opinion-and-Issues/Quid-pro-quo-A-study-of-sexual-bribery-in-Sri-Lanka/14-694260
- 'ලිංගික කප්පම්: නව නාමයක්, පැරණි අපරාධයක්' Ceylon Independent 2020 ජනවාරි 04 (http://www.independent.lk/sextortion-a-new-name-an-age-old-crime/ )
- 'හමුදා වැන්දඹුවන් ලිංගික අල්ලසට ලක්වීම: අනුරාධපුර, කුරුණෑගල, සහ ගාල්ල දිස්ත්‍රික්ක' (සමානාත්මතාවය සඳහා වූ යුක්ති කේන්ද්‍රය, ජූලි 2018)
- ලිංගික අල්ලස්: දූෂණයේ නිහඬ කල පැත්ත් ඩ්සකහ ජඹ 2020 සැප්තැම්බර් 3, https://www.ft.lk/Opinion-and-Issues/Sexual-bribery-The-silenced-side-of-corruption/14-705482
- 'ශ්‍රී ලංකාවේ යුද්ධයේ බලපෑමට හසුවූ උතුරු පළාතේ කාන්තා ගෘහ මූලිකයන් ලිංගිකව සූරාකෑම' (සමානාත්මතාවය සඳහා වූ යුක්ති කේන්ද්‍රය, මාර්තු 2016)
- 'රහස් බව තුල මුවාවී: පස්චාත් යුධ දිස්ත්‍රික්ක තුල මුස්ලිම් කාන්තාවන් ලිංගික අල්ලසට ලක්වීම' (සමානාත්මතාවය සඳහා වූ යුක්ති කේන්ද්‍රය, ජූලි 2018)
- වාර්ෂික කාර්ය සාධන වාර්තාව : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව 2019
- ලිංගික කප්පම් වටා ඇති නිශ්ශබ්දතාවය බිඳ දැමීම: බලය, ලිංගිකත්වය සහ දූෂණය අතර සම්බන්ධතාවය 8 (ට්‍රාන්ස්පෙරන්සි ඉන්ටර්නැෂනල්, 2020)
- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ රැකියා සංගණනය - 2016 (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2018)
- 'ගෝලීය දූෂණ බැරෝමීටරය' (ට්‍රාන්ස්පෙරන්සි ඉන්ටර්නැෂනල්, 2019)
- කතුබ්දීන්ට එරෙහිව ශ්‍රී ලංකා ජනරජය [1998] 3 ශ්‍රී එල් ආර් 107
- නම් කිරීම, ලැජ්ජා කිරීම සහ ලිංගික කප්පම් ගැනීම අවසන් කිරීම: මෙවලම් කට්ටලය (ජාත්‍යන්තර කාන්තා විනිසුරුවන්ගේ සංගමය 2012)
- ලිංගික කප්පම්: දූෂණය සහ ලිංගික සූරාකෑමේ අපරාධයක් (ජාත්‍යන්තර නීතිඥ සංගමය 2019)
- දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය 2004
- අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය 2000

**සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය**

16/1, මොරිස් පෙදෙස, කොළඹ 05, ශ්‍රී ලංකාව

දු.ක/ෆැක්ස්: +94 11 2055404

www.cejsrilanka.org | srilanka.cej@gmail.com

/Centre-for-Equality-and-Justice
/cej_srilanka
/CEJ_SriLanka
/channel/CEJ Sri Lanka

ISBN 9786245847211